# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2161/32 - 2020 පෙබරවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2020.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ වැනි ව්‍යවස්ථාව පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 155එ වැනි ව්‍යවස්ථාව පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව එකී බලතලවලින් ඇතැම් බලතල 2017 අප්‍රේල් මස 24 වැනි දින අංක 2016/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උපලේඛනයේ නියම කර ඇති පරිදි පොලිස්පතිවරයා සහ පොලිස් නිලධාරීන් වෙත පවරා ඇත.

2020.01.29 දින සිට ක්‍රියාත්මක වන පරිදි, එම ගැසට් පත්‍රයේ උපලේඛනය වෙනුවට පහත සඳහන් උපලේඛනය ආදේශ කරනු ලැබේ.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියම පරිදි,

**කේ. ඩබ්ලිව්. ඊ. කරල්ලියද්ද,**
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2020 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 07,
9 වන ගොඩනැගිල්ල,
බණ්ඩාරනායක ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාව,
ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *I වැනි තීරුව නිලධාරි වර්ගීකරණයන්* | *II වැනි තීරුව පවරනු ලබන බලතල* | *III වැනි තීරුව බලතල පවරන ලද නිලධාරීන්* |
|---|---|---|---|
| 01. | ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරි කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බඳවා ගැනීමේ පටිපාටිය/සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව තනතුරුවලට පත්කිරීම සහ උසස් කිරීම<br>ii. පරිවාස කාලය තුළදී පත්වීම අවලංගු කිරීම හෝ සේවය නතර කිරීම<br>iii. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ස්ථාන මාරු කිරීමේ පටිපාටියට අනුකූලව ස්ථාන මාරු කිරීම<br>iv. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>v. වැඩ තහනම් කිරීම<br>vi. සේවය අතහැරයාම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සළකා බැලීම. | පොලිස්පතිවරයා |
| 02. | ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරි කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පටිපාටියට අනුව ස්ථාන මාරු කිරීම<br>ii. විනය පාලනය<br>iii. වැඩ තහනම් කිරීම<br>iv. සේවය අතහැරයාම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සළකා බැලීම | පොලිස්පතිවරයා/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් |
| 03. | ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරි කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) | i. පරිවාස හෝ වැඩ බැලීමේ කාලසීමාවට පසු පත්වීම ස්ථිර කිරීම<br>ii. සේවයෙන් ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් ලැබෙන ලිපි භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම | පොලිස්පතිවරයා/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා (පරිපාලන) |
| 04. | ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරි කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) | i. යම් නිලධාරියෙකුගේ ඊළඟ නිලයට, ශ්‍රේණියට හෝ තනතුරට උසස් කිරීමෙන් පසු, එක් වරකට වර්ෂය බැගින් උපරිම වශයෙන් වසර 03ක අනිවාර්ය වැඩ බැලීමේ සේවා කාලය දීර්ඝ කිරීම | පොලිස්පතිවරයා/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් |

**උපලේඛනය (සම්බන්ධිතයි)**

| *අනු අංකය* | *I වැනි තීරුව නිලධාරි වර්ගීකරණයන්* | *II වැනි තීරුව පවරනු ලබන බලතල* | *III වැනි තීරුව බලතල පවරන ලද නිලධාරින්* |
|---|---|---|---|
| | | ii. කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා වරකට වර්ෂය බැගින් උපරිම වශයෙන් වසර 03ක් පරිවාස කාල සීමාව දීර්ඝ කිරීම. | |
| 05. | පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරි කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති පටිපාටීන්ට අනුකූලව ඒ ඒ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පරිපාලන බල ප්‍රදේශ තුළ ස්ථාන මාරු කිරීම්<br><br>ii. සේවයෙන් පහකිරීම් හැර ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශය තුළ විනය පාලන කටයුතු<br><br>iii. සේවය අතහැරයාම සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සලකා බැලීම. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා |
| 06. | පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරි කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ක්‍රමවේදයන්ට අනුකූලව නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ පරිපාලන බල ප්‍රදේශය යටතට ගැනෙන ස්ථාන මාරුකිරීම්. | නියෝජ්‍ය පොලිස්පතිවරයා |
| 07. | පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරි කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) | i. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති ක්‍රමවේදයන්ට අනුකූලව ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි I ශ්‍රේණිය)<br><br>ii. පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි II ශ්‍රේණිය) වරුන්ගේ ඒ ඒ පරිපාලන බල ප්‍රදේශය යටතට ඇතුළත් ස්ථාන මාරුකිරීම්. | නියෝජ්‍ය පොලිස්පතිවරුන් හා කොට්ඨාස භාර නිලධාරීන් |
| 08. | පොලිස් පරීක්ෂක සහ ඊට පහළ නිලයන් (පොලිස් ස්ථාන භාර ස්ථානාධිපතිවරුන් සහ ක්‍රියාකාරි කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර) | i. ඒ ඒ පරිපාලන බල ප්‍රදේශයන් තුළ වැඩ තහනම් කිරීම<br><br>ii. අදාළ පරිපාලන බල ප්‍රදේශය තුළ විනය ශාලා දඬුවම් නියම කිරීම. | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති<br><br>නියෝජ්‍ය පොලිස්පති<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි I ශ්‍රේණිය)<br><br>පොලිස් අධිකාරි (පොලිස් අධිකාරි II ශ්‍රේණිය)<br><br>සහකාර පොලිස් අධිකාරි |

උපලේඛනය (සම්බන්ධිතයි)

| *අනු අංකය* | *I වැනි තීරුව නිලධාරි වර්ගීකරණයන්* | *II වැනි තීරුව පවරනු ලබන බලතල* | *III වැනි තීරුව බලතල පවරන ලද නිලධරින්* |
|---|---|---|---|
| 09. | මහ සැරයන්/පොලිස් සැරයන්/පොලිස් කොස්තාපල්/පොලිස් කොස්තාපල් රියදුරු නිලයන්ට අදාළ නිලධාරි/නිලධාරිනියන් | i. සේවයෙන් පහකිරීම හැර ඔවුන්ගේ පරිපාලන බල ප්‍රදේශය තුළ විනය පාලන කටයුතු<br>ii. සේවය අතහැර යාමේ නිවේදනය සම්බන්ධයෙන් ලැබෙන අභියාචනා සළකා බැලීම. | නියෝජ්‍ය පොලිස්පතිවරුන් |

02 - 405

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.